# උතුරු පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ පවතින තනතුරු වලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2017

උතුරු පළාත් රාජ්‍ය සේවයේ පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2017.06.16**වේ.

| අංකය | තනතුරු නාමය | තනතුරු අංකය | පුරප්පාඩු |
|---|---|---|---|
| I | ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරී(සිවිල් - Civil) III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2017 | 01 | 61 |
| II | ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරී(සිවිල් - Civil) පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2017 | 02 | |
| III | ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරී(රසායනාගාර තාක්ෂණික- Labouratary Technician) III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2017 | 03 | 06 |
| IV | ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරී(රසායනාගාර තාක්ෂණික - Labouratary Technician) පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2017 | 04 | |
| V | ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරී(සැලසුම් ශිල්පී - Draughtsmen)පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2017 | 05 | 03 |

**02. සේවා කොන්දේසි:-**

1. අනුමත සේවා ව්‍යවස්ථාව හා බඳවා ගැනීමේ පරිපාටියට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ.මෙම පත්වීම් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.
2. මේවා ස්ථාන මාරුවීම් සහිත සේවා වේ. මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන අය උතුරු පළාතේ කුමන ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

**03. සාමාන්‍ය සුදුසුකම්:-**

අ)අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

ආ)යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

ඇ)i. උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. එනම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වර්ෂ 06ක කාලයෙන් අඩුම වශයෙන් වර්ෂ 03ක් වත් උතුරු පළාත තුළ ස්ථිරව හා නොකඩවා පදිංචිය ඇති අයෙකු විය යුතුය.

**හෝ**

ii. අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර අවම වශයෙන් අවුරුදු 05ක් උතුරු පළාතේ නොකඩවා පදිංචිව සිටිය යුතුය.(සම්මුඛ පරීක්ෂණයේදී ස්ථිර පදිංචි තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

**සටහන :**

එක් අයදුම්කරුවෙකුට එක් දිස්ත්‍රික්කයක් තුළින් පමණක් අයදුම් කළ හැකි අතර වෙනත්දිස්ත්‍රික්ක වල පවතින පුරප්පාඩු සඳහා අයදුම් කළ නොහැක.අයදුම්කරුවන් සිය කැමැත්තෙන් තෝරා ගන්නා ලද දිස්ත්‍රික්කය පසුව වෙනස් කරනු නොලැබේ.

ඈ) අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**04. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :-**

| අනු අංකය | තනතුරු නාමය | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| 01 | තාක්ෂණික නිලධාරී (සිවිල් - Civil) III වන ශ්‍රේණිය | භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි),විද්‍යාව,ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06)අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත් විය යුතු වීම.<br><br>සහ<br>ශුද්ධ ගණිත /ව්‍යවහාරික ගණිතය/සංයුත්ක ගණිතයසමග භෞතික විද්‍යාව යන විෂයයන්ඇතුළුව විෂයයන් තුනකින් | (1) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව(සිවිල් - Civil)සහතිකය,<br>**හෝ**<br>(2) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ඉංජිනේරු විද්‍යා (සිවිල් - Civil)ජාතික ඩිප්ලෝමා සහතිකය,<br>**හෝ**<br>(3) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු(සිවිල් - Civil) ඩිප්ලෝමා සහතිකය, |

| | | | |
|---|---|---|---|
| | තාක්ෂණික නිලධාරී (රසායනාගාර තාක්ෂණික - Labouratary Technician) III වන ශ්‍රේණිය | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය(ගණිතය විෂය ධාරාව) එකවර සමත් වීම. | **හෝ**<br>(4) ශ්‍රී ලංකාවේ පිළිගත් විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික (සිවිල් - Civil) ඩිප්ලෝමා සහතිකය,<br>**හෝ**<br>(5) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය(IESL) විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම,<br>**හෝ**<br>(6) තාක්ෂණික නිලධාරී(සිවිල් - Civil) අංශයට අදාළජාතික වෘත්තීය කුසලතාවේ (NVQ) 06 වන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කිරීම.<br>**හෝ**<br>(7) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ඉහත සඳහන් තාක්ෂණික සහතිකයේ නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලුම අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| 02 | තාක්ෂණික නිලධාරී(සිවිල් - Civil)පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය)<br><br>තාක්ෂණික නිලධාරී (රසායනාගාර තාක්ෂණික - Labouratary Technician) පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි), විද්‍යාව,ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් විය යුතු වීම.<br><br>සහ<br>ශුද්ධ ගණිත / ව්‍යවහාරික ගණිතය/සංයුක්ත ගණිතය සමග භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් තුනකින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය (ගණිතය විෂය ධාරාව)එකවර සමත් වීම. | (1) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ(සිවිල් - Civil) ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය(NCT) ලබා තිබීම.<br>**හෝ**<br>(2) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ(සිවිල් - Civil) ක්ෂේත්‍රයක ජාතික සහතික පත්‍ර පාඨමාලාවක් (NCC) සාර්ථකව හදාරා සහතිකය ලබා තිබීම.<br>**හෝ**<br>(3) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ඊහත සඳහන් තාක්ෂණික සහතිකයේ නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලුම අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| 03 | තාක්ෂණික නිලධාරී (සැලසුම් ශිල්පී - Draughtsmen) පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි), විද්‍යාව,ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් විය යුතු වීම.<br>සහ<br>ශුද්ධ ගණිත / ව්‍යවහාරික ගණිතය/සංයුක්ත ගණිතය සමග භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් තුනකින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය (ගණිතය විෂය ධාරාව)එකවර සමත් වීම. | (1) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයකින් එක් වාර්ෂික සැලසුම් ශිල්පී පූර්ණ කාලීන පාඨමාලාව සම්පූර්ණයෙන් හදාරා සහතිකය ලබා තිබීම.<br>**හෝ**<br>(2) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ඊහත සඳහන් තාක්ෂණික සහතිකයේ නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලුම අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

**සටහන**

- තාක්ෂණික නිලධාරී III වන ශ්‍රේණියට කෙලින්ම බඳවා ගනු ලැබේ.
- තාක්ෂණික නිලධාරී III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින් අවශ්‍ය ප්‍රමාණයට නොමැති විටෙක එම ශ්‍රේණියට අදාළව ඉතිරිව ඇති පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට බඳවා ගන්නා ලද අය මගින් එම පුරප්පාඩු පුරවනු ලැබේ.

**05**. **බඳවා ගැනීමේ ක්‍රමය :-**

- ලිඛිත තරඟ විභාගයේ කුසලතා අනුපිළිවෙළ අනුවද, බඳවා ගන්නා අවස්ථාවේදී පවතින රජය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පරිපාටිය, ජාතික හා පළාත් නීති රීතිවලට අනුව ද බඳවා ගනු ලැබේ.ලැබෙන ඉල්ලුම්පත් සංඛ්‍යාව අනුව ලිඛිත පරීක්ෂණය පැවැත්වීම තීරණය කරනු ලැබේ.
- මෙම විභාගය සමත් වීමට අවම වශයෙන් 40% ලකුණු ලබා ගත යුතුය.
- අයදුම්කරුවන් ලබාගත් මුළු ලකුණු අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.මේ අවස්ථාවේදී අමතර ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ. සම්මුඛ පරීක්ෂණයේදී මෙම දැන්වීමේ සඳහන් සියළු සුදුසුකම් සම්පූර්ණයෙන්ම පරීක්ෂා කරනු ලබන අතර අදාළ සුදුසුකම් නොමැති බව සනාථ වුවහොත් මෙම තනතුරු සඳහා ඇති හිමිකම් අහෝසි වේ.
- **පුරප්පාඩු වලින් 3%ක් ආබාධිතයන් සඳහා වෙන් කරනු ලැබේ. අයදුම්කරුවන් පත්වීම සඳහා තේරීමේදී ආදාළ තනතුරේ සේවය කිරීමට ඔහුගේ ආබාධිත තත්වය රාජකාරි කටයුතු කිරීමට බාධාවක් නොවන බවට වෛද්‍ය පරීක්ෂණයකින් සනාථ කළ යුතුය.**

*සටහන:-*

ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර මේ සඳහා අවශ්‍ය සුදුසුකම් සියල්ලම සපුරා තිබිය යුතුය. විභාග ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් යොමු කරනු ලබන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**06**. **විභාග ගාස්තු:-**

අයදුම්කරුවන් පදිංචිව සිටින උතුරු පළාතේ පිහිටි කුමන හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් මගින් විභාග ගාස්තු වශයෙන්,**උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්**තුමාගේ **3401** අංක දරණ ගිණුමට රු **500/=**ක මුදලක් ගෙවා ලබා ගන්නා ලදරිසිට්පත අයදුම්පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන ලෙස අලවා එවිය යුතුය. කිසිඳු හේතුවක් මත මෙම විභාග ගාස්තු නැවත ලබා නොදෙන අතර වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

**07**. **ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-**

- මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 (21සෙ.මී.X29සෙ.මී.)කඩදාසියක දෙපැත්තම භාවිතා කර අයදුම්පත්‍රය සකස් කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2017.06.16** දිනට හෝ ඊට ප්‍රථමයෙන් ලැබෙන සේ **"ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,උතුරු පළාත, අංක 393/48, කෝවිල පාර, නල්ලූර්, යාපනය."** යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුරේ නම සඳහන් කළ යුතුය.

- මධ්‍යම රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුක්ත නිලධාරීන් අයදුම්පත් යොමු කිරීමේදී තම ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතුය.

- එක් තනුරකට වඩා වැඩි තනතුරු ගණනක් සඳහා ඉල්ලුම් කිරීමට කැමති සුදුසුකම් ඇති අයදුම්කරුවන් තමන් වඩාත් කැමති අනුපිළිවෙළ අනුව නියමිත පරිදි ඉල්ලුම්පත් සම්පූර්ණ කර එවිය යුතුය. නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.ඉල්ලුම්පතේ ඡායා පිටපත හෝ කලින් එවනු ලබන පිටපත් භාර ගනු නොලැබේ.

- අයදුම්පත් එවන ලද අයදුම්කරුවන් වෙත **මෙම විභාගය පැවැත්වීමට දින 03කට ප්‍රථමයෙන්** අනුමත **ප්‍රවේශ පත්‍රයනොලැබී තිබේ නම්**, අනුමත ප්‍රවේශ පත්‍රය නොලැබුණ බව සියළු තොරතුරු සමග **"ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,උතුරු පළාත, අංක 393/48, කෝවිල පාර, නල්ලූර්, යාපනය."** යන ලිපිනයට දැනුම් දීම හෝ **021 - 221 9939** හා ෆැක්ස් අංකය **021 - 221 9940** දරණ කාර්යාලයීය දුරකතන අංකය වෙත දැනුම් දිය යුතුය.

**08. විභාග පවත්වන නගර :-**

විභාගය පැවැත්වීමට තීරණය කරන ලද විභාග නගර හා ඒවාට අදාළ අංක පහත සඳහන් වේ.

| **නගරය** | **නගර අංකය** |
|---|---|
| යාපනය | 01 |
| වවුනියාව | 03 |

එක් විභාග නගරයක් වෙනුවෙන් ලැබෙන ඉල්ලුම්පත් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන අවස්ථාවේදී මෙම විභාගය යාබඳව පිහිටා ඇති විභාග නගරය වෙත මාරු කරනු ලැබේ.

**09. භාෂා මාධ්‍යය :-**

විභාග සියල්ලම සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යය දෙකෙන්ම පවත්වනු ලැබේ.

**10.** වැටුප් පරිමාණය :-

- ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරී සිවිල් / රසායනාගාර තාක්ෂණික III වන ශ්‍රේණියට රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 03/2016 හි වැටුප් කේත අංක **MN3-2016 අනුව** බඳවා ගනු ලබන ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරී (සිවිල්) / රසායනාගාර තාක්ෂණික III ශ්‍රේණියට, අදාල වන මාසික වැටුප් පරිමාණයරු: **31,040/= - 10x445 - 11x 660 - 10x730 - 10x750 - 57,550/=වේ.** (රු. 31,930/= වැටුප් පියවරට පැමිණීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකින් සමත් විය යුතුය.) එහෙත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.
- ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරී සිවිල් / රසායනාගාර සහකාර / සැලසුම් ශිල්පී පුහුණු ශ්‍රේණියට රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ **03/2016**ට අනුව එම චක්‍රලේඛයේ උපලේඛන V සඳහන්වූ විධිවිධාන වලට අනුකූලව මාසික දීමනාව හා **ගැලපුම් දීමනාවක්** ගෙවනු ලැබේ.
  - **පළමු වර්ෂය -** රු 18,728.00/=
  - **දෙවන වර්ෂය -** රු18,935.00/=

  } හා **ගැලපුම් දීමනාවක්**

**11. ලිඛිත පරීක්ෂණය:-**

මෙම විභාගය දෙමළ/ සිංහල යන මාධ්‍යය දෙකෙන්ම පැවැත්වේ.මෙම විභාගය පහත පරිදිප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| **ප්‍රශ්න පත්‍රය** | **කාලය** | **මුළු ලකුණු** | **සමත් වීම සඳහා ලබා ගත යුතු ලකුණු ප්‍රමාණය** |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| තාක්ෂණික දැනුම සම්බන්ධ පරීක්ෂණය | පැය 03 | 100 | 40 |

**විෂය නිර්දේශය :-**

- **බුද්ධි පරීක්ෂණය**
  අපේක්ෂකයාගේතර්කානුකූලව සිතීමේ හැකියාව, තීරණ ගැනීමේ හැකියාව, හා විශ්ලේෂණය කිරීමේ හැකියාව යනාදිය පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න වලින් සමන්විත වේ.
- **තාක්ෂණික දැනුම සම්බන්ධ පරීක්ෂණය- තාක්ෂණික (සිවිල් / රසායානාගාර තාක්ෂණික)**
  මෙම ප්‍රශ්න පත්‍රය මගින් අපේක්ෂකයාගේ ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් මූලික දැනුම , ගොඩනැගිලි ද්‍රව්‍ය, ගොඩනැගිලි වලට අදාළ සැලසුම් (Plan) ඇඳීම හා සැලසුම් (Plan)අවබෝධ කර ගැනීමේ හැකියාව, මැනීම, අත්තිවාරම් දැමීම, පස් වර්ගය , මාර්ග නිර්මාණය කිරීම හා නඩත්තු කිරීම, ඇස්තමේන්තු සෑදීම, ජල සම්පාදනය, කානු සෑදීම හා අපද්‍රව්‍ය ඉවත් කිරීම යනාදිය සම්බන්ධයෙන් ඇති දැනීම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න වලින් සමන්විත වේ.
- **තාක්ෂණික දැනුම සම්බන්ධ පරීක්ෂණය - සැලසුම් ශිල්පී**
  ගෘහ නිර්මාණ ශිල්පය, ප්‍රමාණයට අනුව ඇඳීම,සැලසුම් සටහන පිළිබඳ දැනීම ලබා ගැනීමේ හැකියාව, සැලසුම නවීකරණය කර නිර්මාණ කිරීම සම්බන්ධ මූලික දැනීම, මැනීම සම්බන්ධ මූලික දැනීම, ජ්‍යාමිතික ගණිත හා යාන්ත්‍රික සැලසුම් ඇඳීම සම්බන්ධයෙන් ඇති මූලික දැනීම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න වලින් සමන්විත වේ.

**12. අසත්‍ය බව තහවුරු වූ විට ලබා දෙන දඬුවම්:-**

අයදුම්පත්‍ර පිරවීමේදී ඉතා සැලකිල්ලෙන් නිවැරදිව තොතුරු සැපයිය යුතුය.අයදුම්කරු ඉදිරිපත් කළ යම් කිසි තොරතුරක් අසත්‍ය බව තහවුරු වුවහොත් කුමන අවස්ථාවක හෝ අපේක්ෂකයා පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කළ හැක.

**13.** මෙම දැන්වීමේ සඳහන් නොකළ හෝ අපැහැදිලි කරුණු සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අවසන් තීරණය ගනු ලැබේ.එමෙන්ම භාෂා පරිවර්තනයේදී සිදු වන වෙනස්කම් පිළිබඳව සැළකීමේදී දෙමළ භාෂාව නිවැරදි ලෙස සැළකේ.

උතුරු පළාත් සභාවේ **www.np.gov.lk** යන වෙබ් අඩවියට පිවිසීමෙන් මෙම දැන්වීම සම්බන්ධ තොරතුරු ලබා ගත හැක.

**රූ.වරදලිංගම්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.